# මහාමාර්ග අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය

## විසර්ජන ශීර්ෂය 117 - මහාමාර්ග අමාත්‍යාංශය

1. මහාමාර්ග අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් ප්‍රකාශ අන්තරගත වූ විසර්ජන ගිණුම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිළධාරී වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ හා පොත් අනුව මහාමාර්ග අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණු අතර එය පිළියෙල කර තිබුණේ 2010 මාර්තු 16 දිනදීය. මේ හේතුව නිසා 2010 වර්ෂයේ ජනවාරි - මාර්තු මාසවලදී අමාත්‍යාංශ කටයුතු නිසි සැලසුමකට අනුව කිරීමට නොහැකිව තිබුණි.

#### (ආ) ගිණුම් ඉදිරිපත් කිරීම.

අමාත්‍යාංශය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| **ශීර්ෂය/ විෂය අංක** | **ගිණුමේ නම** |
|---|---|
| 117 | විසර්ජන ගිණුම |
| 11701 | රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම |

**(ඇ) විසර්ජන ගිණුම**

**(I) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 89,507,920,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. 84,729,932,409 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ඉතිරිවීම් රු.4,777,987,591 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.33 ක් විය. විස්තර පහත දැක්වේ.

| **වියදම් වර්ගය** | **ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය** රු. | **ශුද්ධ ප්‍රතිපාදනය** රු. | **වියදම** රු. | **ඉතිරිය** රු. | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** % |
|---|---|---|---|---|---|
| පුනරාවර්ථන | 111,420,000 | 120,910,000 | 115,694,652 | 5,215,348 | 4.3 |
| මූලධන | 83,400,900,000 | 89,387,010,000 | 84,614,237,757 | 4,772,772,243 | 5.3 |
| එකතුව | 83,512,320,000 | 89,507,920,000 | 84,729,932,409 | 4,777,987,591 | 5.3 |

**(II) අයවැය විචලනය**

**(i)** මූලධන වැය විෂයයන් 09 ක් යටතේ හා පුනරාවර්තන වැය විෂයයන් 01 ක් යටතේ ප්‍රතිපාදන කර තිබූ එකතුව රු. 502,625,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ii)** මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 17 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු මුදලින් 50% කට වඩා වැඩි ඉතිරිවීම්වල වටිනාකම රු. 838,120,396 ක්බව නිරීක්ෂණය විය.

**(iii)** කොන්ත්‍රාත් පිරිනැමීම නියමිත කාලය තුල සිදුනොකිරීම හා කොන්ත්‍රාත් ප්‍රදානය නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 03 ක් යටතේ ප්‍රතිපාදිත රු. 83,600,000 ක් වූ මුදලින් රු. 18,008,954 ක් ප්‍රතිපාදන ඉතිරි වීම් සිදුවී තිබුණි.

**(iv)** කොන්ත්‍රාත්කරුවන්ගේ පසුගාමී ක්‍රියාකාරීත්වය නිසා අදාල ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වීමෙන් වැය විෂයයන් 04 ට අදාලව ප්‍රතිපාදනය කර තිබුණු රු. 669,500,000 ක මුදලෙන් රු. 577,362,920 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වීම් දක්නට ලැබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

2010 දෙසැම්බර් 31 දිනට අංක 6000/0/0/3/253 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.53,984,771 ක් වූ අතර ඒ පිළිබඳව කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 1 ට වැඩි 2 ට අඩු<br>රු. | වර්ෂ 2 ට වැඩි 3 ට අඩු<br>රු. | 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය<br>රු. |
|---|---|---|
| 37,754 | 53,947,017 | 53,984,771 |

ඉහත ශේෂය තුල මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන පරිදි කටයුතු කල හැකිව තිබුණු නමුත් එසේ කටයුතු නොකල වර්ෂ 02 ට වැඩි කාලසීමාවක සිට පැවති තැන්පත් ශේෂ වල එකතුව රු.1,570,362 ක් විය.

**(ඉ) රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**(අ) සීමා පිළිපැදීම්**

අමාත්‍යාංශය වෙත රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය | විෂය අංකය | උපරිම වියදම් සීමාව<br>රු. | තථ්‍ය<br>රු. | අවම ලැබීම් සීමාව<br>රු. | තථ්‍ය<br>රු. | උපරිම හර කල සීමාව<br>රු. | තථ්‍ය<br>රු. |
|---|---|---|---|---|---|---|---|
| මහාමාර්ග අමාත්‍යාංශය | 11701 | 5,890,000 | 2,716,161 | 1,900,000 | 3,675,521 | 20,000,000 | 13,566,352 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ස්ථාන මාරුවී ගිය නිළධාරින්ගේ රු.50,848 ක් වූ ණය ශේෂයන්, එම නිළධාරීන්ගේ වර්තමාන සේවා ස්ථානයන් සොයාගැනීමට නොහැකි වීමෙන් අයකරගත නොහැකිව තිබුණි. මෙම ශේෂයන් පොත් වලින් කපා හැරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇති බව වාර්තා කර තිබුණි.

**(ii)** මියගිය හා විශ්‍රාම ගිය නිළධාරීන්ගෙන් අයවීමට ඇති රු.50,898 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් පොත් වලින් කපා හැරීමට ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලබන බවට වාර්තා කර තිබුණි.

## 1.4 අනුකූල නොවීම්

### නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්‍ෂණ වලදී නිරීක්‍ෂණය වූ නීති රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව චක්‍රලේඛ විධිවිධාන | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| 2006 මාර්තු 18 දිනැති අංක CSA/P1/40 දරන ජනාධිපති විසින් නිකුත් කර ඇති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය | 116,000 | හිටපු අමාත්‍යවරයා සඳහා අනුමත සම්බන්ධීකරණ ලේකම්වරු සංඛ්‍යාව 2 ක් වන අතර පත්කර තිබුණු සංඛ්‍යාව 3 කි. එම සම්බන්ධීකරණ ලේකම් වෙනුවෙන් වැටුප් ගෙවීම. |
| 2006 ජනවාරි 04 දිනැති අංක CSA/P1/40 දරන ජනාධිපති විසින් නිකුත් කර ඇති ලිපියේ 02.1 ඡේදය | 275,883 | හිටපු අමාත්‍යවරයා සඳහා අනුමත වාහන සංඛ්‍යාව අමතරව පාවිච්චි කල රථය සඳහා රු.65,406 නඩත්තු හා අලුත්වැඩියා වියදම් සහ රු.210,477 ක් රක්‍ෂණ වියදම් දැරීම. |
| - එම - | 166,294 | හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයාට හිමි වාහන සංඛ්‍යාවට අමතරව ලබා ගත් රථය සඳහා අලුත්වැඩියා වියදම් දැරීම. |

## 1.5 අවිධිමත් ගණුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගණුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්‍ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i)** 2010 අප්‍රේල් 08 දින සේවය අවසන් කරන ලද අමාත්‍ය කාර්යය මණ්ඩලයේ නිළධාරීන්ගේ අප්‍රේල් මාසයේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 2:1 වගන්තිය ප්‍රකාර මාසයකින් කොටසක් ගෙවනු වෙනුවට අප්‍රේල් මාසයේම සේවය කලා සේ සලකා මුළු වැටුප ගෙවීම නිසා එකතුව රු.226,290 ක් වැඩිපුර ගෙවීම් සිදු කර තිබුණි.

**(ii)** කොළඹ - නුවර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මූලික කටයුතු 2003 වර්ෂයේදී ආරම්භ කර දැනට ක්‍රියාත්මකව පවතින නමුත් ඒ සඳහා විදේශාධාර ප්‍රදානයන් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 2 සහ 3 ඡේද වලින් දක්වා ඇති වැටුප් පරිමාවන් ව්‍යාපෘති කාර්යය මණ්ඩලයට හිමිකම් නොතිබියදී 28 දෙනෙකුගෙන් යුතු ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා 2010 වර්ෂය තුල රු. 9,479,169 ක වැටුප් ගෙවීම් සිදු කර තිබුණි.

**(iii)** කොළඹ - නුවර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සඳහා වැඩපූර්ව අත්තිකාරම් ගෙවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 සඳහන් උපදෙස් අනුව කොන්ත්‍රාත් මුදලින් 20% ක උපරිමයක් ලෙස ගෙවිය යුතු වුවත් ඉහත වගන්තියට පටහැනිව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 50% ට සමාන මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව රු. 2,689,732 ක මුදලක් වැඩපූර්ව අත්තිකාරම් ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

**(iv)** මාර්ග සහ පාලම් ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම පිණිස පත් කරන ලද උපදේශකවරයෙකුගෙන් කිසිදු සේවයක් ලබා නොගෙන මාසික වැටුප් ලෙස රු. 40,000 ක් ද ඉන්ධන දීමනා රු. 30,000 බැගින් 2010 අප්‍රේල් මාසය වන තෙක් රු. 280,000 ක් ගෙවා තිබුණි. මෙම උපදේශකවරයාට පවරන ලද රාජකාරී හෝ ඔහු විසින් ඉටු කරන ලද රාජකාරී කවරේ දැයි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.6 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) <u>ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදයන්</u>

| **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තුගත පිරිවැය**<br>**රු. මිලියන** | **2010 දෙසැම්බර් 31 දිනට වියදම**<br>**රු. මිලියන** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|
| කොළඹ - නුවර විකල්ප අධිවේගී මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 90,750 | 228.76 | අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමේ දුෂ්කරතා සහ ඉඩම් මැනීමේ ප්‍රමාදයන් |

2003 දී කැබිනට් අනුමැතිය ලද කොළඹ - නුවර අධිවේගී මාර්ගය ඉදිකිරීම හා මෙහෙය වීම හා භාරදීමේ කටයුතු මලයාසියාවේ රාජ්‍ය සමාගමකට පවරා තිබුණද එම කැබිනට් අනුමැතිය, 2010/17 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය

මගින් 2010 ජූලි 17 දින අවලංගු කර තිබුණි. 2011 ඔක්තෝබර් මස වන විටත් ආයෝජකයෙකු තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** බලංගොඩ - බණ්ඩාරවෙල මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක් සඳහා 2008 නිකුත් කල අත්තිකාරම් රු. 20,000 ක්, 2010 ගිණුම් වර්ෂය අවසන් වනවිටද නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 1.7 <u>මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය</u>

2010 ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) <u>ප්‍රමාණවත් ලෙස ඉටු නොකල ප්‍රධාන කාර්යයන්</u>

මගනැගුම වැඩසටහන යටතේ වූ ප්‍රධාන කාර්යයන් කොහෙත්ම ඉටුනොකර හෝ ප්‍රමාණවත් ලෙස ඉටුනොකර හෝ තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i)** මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ 2009 දෙසැම්බර් 24 දිනැති අංක MH/MG/03/01/GEN චක්‍රලේඛයේ 3 ඡේදයේ දක්වා ඇති ව්‍යාපෘති තෝරා ගැනීමේ නිර්ණායකයන්ගෙන් බැහැරව දේශපාලන අධිකාරියේ ඉල්ලීම මත පදනම් වූ මාර්ග 07 ක් ඉදිකිරීම වෙනුවෙන් රු. 2,928,272 ක් වැය කර තිබුණි.

**(ii)** මාර්ග 02 ක ඉදිකිරීම් වලදී ගැටි බැම් (Kerb) උස සම්මත ප්‍රමාණයට සිදුනොකර තිබියදී ඒ සඳහා රු.104,335 ක් වැය කර තිබුණි.

**(iii)** මූල්‍ය හැකියාව සැලකිල්ලට නොගෙන, ප්‍රජාමූල සමිති 25 ක් සඳහා රු.21,183,642 වටිනා කොන්ත්‍රාත් 33 ක කාර්යයන් භාරදී තිබුණි.

**(iv)** ඉටුනොකල කාර්යයන් සඳහා මාර්ග 14 ක් වෙනුවෙන් රු.102,724 ක් වූ ගෙවීම් සිදුකර තිබුණි.

**(v)** මගනැගුම වැඩසටහනේ මාර්ග ඉදිකිරීමේදී මාර්ග 20 ක් සම්බන්ධයෙන් රු. 1,219,223 ක් වූ වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

**(vi)** මගනැගුම මාර්ග ඉදිකිරීම් සම්බන්ධ ප්‍රමාණවත් පරිදි අධීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 16 | 08 |
| **(ii)** | තෘතියික මට්ටම | 02 | 02 | - |
| **(iii)** | ද්විතියික මට්ටම | 74 | 31 | 43 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 34 | 26 | 08 |
| **(v)** | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | - | - |
| | | 134 | 75 | 59 |

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් අවිධිමත් ලෙස ලබා ගත් මානව සම්පත්

| මානව සම්පත් සංඛ්‍යාව | ලබා ගත්තේ කුමන ආයතනයෙන්ද යන වග | ලබාගෙන ඇති කාලපරිච්ඡේදය |
|---|---|---|
| 49 | මාර්ග සංවර්ධන අධිකාරිය | මාස 12 |